# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2340/42 - 2023 ජූලි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2023.07.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2018 අංක 35 දරන මුදල් පනත යටතේ වන නිවේදනය**

මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද

2018 අංක 35 දරන මුදල් පනතේ 19 වන වගන්තිය සමග කියවිය යුතු 51 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මම මෙම නියෝගය මගින් අංක 2334/24 දරන 2023 මැයි මස 31 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනයෙන් අවසන් වරට සංශෝධනය කරන ලද අංක 2147/72 දරන 2019 ඔක්තෝබර් මස 31 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනය පහත පරිදි සංශෝධනය කරමි.

1. අංක 2334/24 දරන 2023 මැයි මස 31 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනයෙන් අවසන් වරට සංශෝධනය කරන ලද මුදල් (මෝටර් වාහන මත සුඛෝපබෝගී බද්ද) නියෝගවල 5 වන ඡේදයේ (ආ) උප ඡේදය වෙනුවට පහත ඡේදය ආදේශ කිරීම මගින් :-

"(ආ) ඉහත (අ) හි නිශ්චිතව දක්වා ඇති ඕනෑම වාහනයක් හැර, මිල, රක්ෂණ, ගාස්තු හා ගැල් කුලී (මි.ර.ගැ.) වටිනාකම හෝ කර්මාන්තශාලා මිල (නිෂ්පාදන මිල) අංක 2312/69 දරන 2022 දෙසැම්බර් මස 31 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ උපලේඛන I හි II වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති සුඛෝපබෝගී බදු නිදහස් සීමාව ඉක්මවා යන සෑම නිශ්චිත මෝටර් රථයක් සඳහාම ඊට අනුරූපව එකී උපලේඛනයේ III වන තීරුවේ සඳහන් අනුපාතයට,

එසේ වුවද, 2018 මාර්තු 06 වැනි දින හෝ ඊට පසු රාජ්‍යතාන්ත්‍රිකයෙකු හෝ රාජ්‍යතාන්ත්‍රික සංවිධානයක් විසින් ලියාපදිංචි කරන ලද, අදාළ වන පරිදි එකී රාජ්‍යතාන්ත්‍රිකයා හෝ රාජ්‍යතාන්ත්‍රික සංවිධානය විසින් 100% ක් බදු වලින් නිදහස් පදනම යටතේ ආනයනය කරනු ලැබූ හෝ දේශීයව මිලදී ගනු ලැබූ මෝටර් රථයක් විකිණීම හෝ අපහරණය මත ගෙවිය යුතු සුඛෝපබෝගී බද්ද මෙහි III උපලේඛනයේ දක්වා ඇති වාහන භාවිත කාලසීමාව මත පදනම්ව".

සහ

2. අංක 2318/53 දරන 2023 පෙබරවාරි මස 10 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් අවසන් වරට සංශෝධනය කරන ලද පරිදි එහි උපලේඛනයේ II වන උපලේඛනයට වහාම ඉක්බිතිව III වන උපලේඛනය ලෙස මෙහි උපලේඛනය ඇතුළත් කිරීම මගින්,

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 ජූලි මස 13 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| III වන උපලේඛනය | |
|---|---|
| *ප්‍රථම ලියාපදිංචි දිනයේ සිට රාජ්‍යතාන්ත්‍රිකයකු හෝ රාජ්‍යතාන්ත්‍රික සංවිධානයක් විසින් භාවිතා කරනු ලැබූ කාලය** | *සුබෝපභෝගී බදු අනුපාතය* |
| වසර 01 කට අඩු හෝ සමාන | ගෙවිය යුතු සුබෝපබෝගී බද්දෙන් 85% |
| වසර 01 කට වැඩි හා වසර 02කට අඩු හෝ සමාන | ගෙවිය යුතු සුබෝපබෝගී බද්දෙන් 75% |
| වසර 02 කට වැඩි හා වසර 03කට අඩු හෝ සමාන | ගෙවිය යුතු සුබෝපබෝගී බද්දෙන් 65% |
| වසර 03 කට වැඩි හා වසර 04කට අඩු හෝ සමාන | ගෙවිය යුතු සුබෝපබෝගී බද්දෙන් 55% |
| වසර 04 කට වැඩි හා වසර 05කට අඩු හෝ සමාන | ගෙවිය යුතු සුබෝපබෝගී බද්දෙන් 45% |
| වසර 05 කට වැඩි හා වසර 06කට අඩු හෝ සමාන | ගෙවිය යුතු සුබෝපබෝගී බද්දෙන් 35% |
| වසර 06 කට වැඩි හා වසර 07කට අඩු හෝ සමාන | ගෙවිය යුතු සුබෝපබෝගී බද්දෙන් 25% |
| වසර 07 කට වැඩි හා වසර 08කට අඩු හෝ සමාන | ගෙවිය යුතු සුබෝපබෝගී බද්දෙන් 15% |
| වසර 08 කට වැඩි | ගෙවිය යුතු සුබෝපබෝගී බද්දෙන් 10% |

**අදාළ වාහනයේ ප්‍රථම ලියාපදිංචි කිරීමේ දිනය හා අපහරණය හෝ විකිණීම සිදු කරනු ලබන දිනය අතර කාලය වාහනය භාවිතා කරනු ලැබූ කාලසීමාව වශයෙන් ගණනය කරනු ලැබේ.*

EOG - 07-0125

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.